

සදාදරණීය මහත්මයෙනි, මහත්මියනි, ඉතිහාසයේ තීර්ණාත්මක මං සන්ධියකට අප පැමිණ ඇත. වසර 30 ක ශාපලත් යුද්ධයේ නිමාව පැමිණ ඇත. ජාතිකත්වයන් එකතු කල එක් මව් බිමක් බිහි කිරීමේ උදාර කාර්යත්වය අප සතුව ඇත.

දරිද්‍රතාවය, අසහනය, වර්ගීකරණය, පළිගැනීම, වෛරයේ දේශපාලනය හේතුවෙන් සිංහලුන් හා දෙමළුන්ගේ ලේ වලින් අප මව්බිම ඉතිහාසයේ කිසිම දවසක නොවූ වියුරු ලෙස තෙත් වී ඇත. මේ සියල්ල සිදු වූයේ විධායක ජනාධිපති ක්‍රමය, සුවිසල් අනුහස් යටතේය.

1948 සිට විධායක අගමැති ධූරය තුලින් රට පාලනය කලෙමු. බණ්ඩාරනායක ඝාතනය තුලින් දේශපාලන පරිපූර්ණතාවක් නොමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය රටේ අගමැති විය. 1967 ආණ්ඩු විරෝධී කුමන්ත්‍රණය පරාජයට පත්ව ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත විය. සිරිමා ශාස්ත්‍ර ගිවිසුම යටතේ පුරවැසිකම් නොලද ඉන්දියානුවන් එරටට පිටමං කරන ලදී. ඉන්දියාව සහ ශ්‍රී ලංකාවට අයිතිව තිබූ කච්චතිව් දූපත ශ්‍රී ලංකාවට හිමි විය. ඉන්දියාව හා පකිස්තාන ගැටුම්වලදී ශ්‍රේෂ්ඨ නායකයෙකු ලෙස සිරිමා බණ්ඩාරනායක මැතිණිය මැදිහත් වී සමතයකට පත් කරන ලදී. ශ්‍රේෂ්ඨ ජාතියක් වූ අපට බටහිර රටවලට වීසා ගැනීම එකල ගැටළුවක් නොවීය. 1977 දී ¾ ක බලයක් පාලක එක්සත් ජාතික පක්ෂයට ලැබීම හා විපක්ෂ නායකයා දමිල ජාතිකයෙකු වීම ද විධායක අගමැති ධූරයේ අනුහස්ය.

එනමුත් 1977 නව ව්‍යවස්ථාව තුලින් නිර්මාණය වූ කිසිවකුට වග නොකියන; විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණයමය අවසන් තීරක බලයේ ජනාධිපති, නීතිය හා සාමය අකර්මන්‍ය කර රට පරාජිත කරන ලදී. රටේ ප්‍රජාතන්ත්‍රවාදය දොල පිදේනි දේශපාලනය විය. රටක පරිපාලන කේඩරය වූ අමාත්‍ය මණ්ඩලය කෑලි කෑලි වලට කඩා රට අකර්මන්‍ය කරන ලදී. පලාත් සභා නම් සුදු අලියා හා 120 දක්වා දුර ගිය නාමික අමාත්‍ය මණ්ඩලය රටේ දේපල ධනය සුරාකන හොර ගුහාවක් විය. ජනාධිපති වරයා මෙන් අම්මගේ අප්පගේ බූදලයෙන් ලැබෙන මුදලින් මෙන් අමාත්‍යාංශ විනාශ කරමින් නව ඇමතිවරු පත් කරමින් සිටී. එයට වැය කරන වෙඩි නොවදින වාහන, කාර්ය මණ්ඩල නිලධාරීන්, විදේශවල බැල මෙහෙකම් කරන අම්මලගෙන් සහ රටේ ජනතාවගෙන් සූරාකන විවිධාකාර බදු මුදල් වලින් ලබා ගනී.

වර්තමාන ජනාධිපතිගේ අවුරුදු 4ක කාලය තුල රටට සිදුවු දෙයක් නැත. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අකර්මන්‍ය කරන ලදී. ජනාධිපතිවරයා සිය පිරිවර 100 ගනන් රැගෙන විදේශ සංචාරවල නිරත විය. සෑම අවුරුද්දකම ඡන්ද වසරක් විය. නාමික ඇමතිවරු ටකෙරන් ඇමති, උළු ඇමති, බත් පැකට් ඇමති, මැර ඇමති වැනි විවිධ අංශවලට බෙදා ඔවුනට ප්‍රදේශවල ඡන්ද කටයුතු බාර දෙන ලදී.

ඇමතිවරු 6 දෙනා බැගින් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයට දරුවන්ගේ අධ්‍යාපන ප්‍රශ්න පතක් සාදා ගැනීමට නොහැකි විය. අධ්‍යාපන ප්‍රශ්න පත්‍රයේ බුද්ධාගම විෂය ද ගණිත ප්‍රශ්න පත්‍රයේ විද්‍යාව ද සමහර ප්‍රශ්න පත්‍ර සමඟ උත්තර ද පිටවිය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෙහෙත් කල් ඉකුත් වූ බෙහෙත් වර්ග විය. සෑම දිනම රටේ වසංගත උණක් වර්ධනය වන වසරක් විය. මෙම සියල්ලෙන්ම නිර්මානය වන්නේ සෞඛ්‍ය සම්පන්න බුද්ධිමත් පරපුරක් රට තුලින් බිහි නොවූ බවයි.

එසේම රටක කොඳු නාරටිය බඳු වූ අමාත්‍ය මණ්ඩලය විනාශ කිරීමේ ඵලයේ කාලකන්නි ස්වභාවය තුල මෙතෙක් ලාභ ලැබූ වරාය, ශ්‍රී ලංකා ගුවන් සේවය, තෙල් සංස්ථාව, ශ්‍රී ලංකා ක්‍රිකට් පාඩු පිට පාඩු ලබන ආයතන බවට පත් විය.

පසුගියදා හිටපු හමුදාපති හමුදාවට එරෙහිව ද්‍රෝහී ප්‍රකාශයක් කල බවට පුවත්පතක පල විය. ඊශ්‍රායලය වැනි රටක නම් එම පුවත්පත් සීල් කර අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන බවට සැකයක් නොමැත. නමුත් ගෞරවනීය රජයක් ලෙස එයට එරෙහිව කිසිම පරීක්ෂණයක් නොගත් අතර, කේතලයේ කල්ව පෙන්වා හිනාවෙන මුට්ටිය මෙන් ගෞරවනීය යුද්ධයේ ජයග්‍රහණය ලබා දුන් විරුවන්ගේ ජීවිත වෙන්දේසි කරමින් සිටී.

ගෞරවනීය හිතවත විධායක ජනාධිපති ක්‍රමය ත්‍රස්තවාදය මෙන් මුලිනුපුටා දැමිය යුතු විනාශකාරී අවියකි. සමානාත්මතාවය, සහෝදරත්වය, මිනිස්කම විනාශ කරන – පාලකයාට සිතූ පැතූ සැප සම්පත් දෙන කාලකන්නි කප්රුක විනාශ කර දැමිය යුතුය.

මිනිසුන් වූ අප කඳක් බඩක් ඇති සත්ත්වයෝ පමණක් නොව වර්ණවත් ඉතිහාසයක් නිර්මාණය කල මිනිසුන් වෙමු. අවුරුදු සිය ගණන් තිස්සේ ලාදුරු, මැලේරියාවට බෙහෙත් සෙවූ මිනිසුන් අවසානයේ එයට බෙහෙතක් සොයා ගත්තෙමු. අප මෙවර ද විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා වූ සාධාරණ උත්සාහයට ගෞරවනීය දායකත්වයක් ලබා දෙමු.

අදම මව්බිමේ සිටින ඥාති හිතවතුන් සමඟ ඔබේ අදහස ගලපා ඔවුන්ගේ ඡන්දය මේ ආත්මාර්ථකාමී යක්ෂයා විනාශ කිරීමට යොදවන්න.

ඉතිහාසය පුරා රට දැය වෙනුවෙන් දිවි පිදූ සියලු මිනිසුන් මේ මොහොතේ ඔබේ තීරණය දෙස බලා සිටිනු ඇත. ඔබ ගන්නා වූ තීරණය අවුරුදු 30 කාලකන්නි ඉතිහාසයේ සුවිශේෂ හැරවුම් මං සලකුණක් වනු ඇත. ඔබ රන් ඉතිහාසය උරුමකරුවන් වනු ඇත.